# පිටසක්වලයෙක් ඇවිත්



රනුදි නෙතුම්සා

**කෘතියේ නම**

පිටසක්වලයෙක් ඇවිත්

**කතෘගේ නම**

රනුදි නෙතුම්සා

**කතෘගේ වෙනත් කෘති**

- මගේ පුංචි කිට්පැටියා
- මගෙ සුරතල් බලුපැටියා

**පාසල**

මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර

**ඉගෙනම ලබන පන්තිය** -

5 ශ්‍රේණිය - E

ISBN – 978-624-208-694-1

2025.02.08

-

# පිදුම

පොතක් ලියන්නට මග කියා දුන්

සෙනෙවිරත්න මහලේකම්

ගුරු පියාණනි, අප දිරිමත්කල

පන්තිභාර සජීව තිලකරත්න

ගුරු පියාණනි ඔබ වෙත

..........................

## පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණියුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළපොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදූවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය හික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන හෙරණගත්කරණීv ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදූහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදූහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

ඔන්න එකෝමත් එක ගමක ගැමි ගෙදරක ගැහැණු ළමයෙක් හිටියා. එයාගෙ නම තමයි සොෆියා. එයා හිටියේ එයාගේ අම්මාත් තාත්තාත් එක්ක.



එයා දවසක් අම්මාට කිවුවා.

"අනේ අම්මේ මට ලොකුම ලොකු ආශාවක් තියනවා

ආ......ඒ මොකක්ද මගෙ පැටියෝ ?

"මට පිටසක්වලයෙක් බලන්න ඕනී අම්මේ"

මොකක්......?

අනේ මගෙ පැටියෝ පිටසක්වලයො කියන්නේ අපට වඩා ගොඩක් දුර ඉන්න අය ඒක නිසා අපට එයාලව බලන්න බෑ පැටියෝ.දැන් රෑ කෑමකාලා නිදාගන්නකෝ.

හරි අම්මේ සුබ රාත්‍රියක් දෙන්නටම සොෆියා නිදාගන්න ගියා.



එකපාරම සොෆියාට ලොකු සද්දයක් ඇහුනා. එයා ඒ සද්දෙට හොඳටම බයවුනා. සොෆියා ගිහින් බැලුවා. එයා ගොඩක් පුදුම වුනා මොකක් මේ පිටසක්වලයින් නේද?



"ඔව්. ඒ අපි තමයි. ඔයාගෙ නම සොෆියා නේද?" ඔව් ඒ මම තමයි ඔයාලා කොහොමද මගේ ගෙදර හොයාගත්තේ?

ඒක පොඩි රහසක් මට නම් අද හරිම සතුටුයි ඇයි අද විතරක් නෑ මගේ ලොකුම හීනය හැබෑවුණා. ලොකුම හීනය මොකක්ද? පිටසක්වලයො බලන එක.

"ආ ඒකද ඔයාගේ ලොකුම හීනය"

ඔව් ඒක තමා මේ මට පොඩි ප්‍රශ්නයක්නම් තියනවා

ආ මොකක්ද ප්‍රශ්නෙ?

ඔයා කැමතිද අපේ ග්‍රහලෝකයට යන්න

ඔව් මම ගොඩක් ආශයි. එහෙනම් අපිදැන්ම පිටත්වෙමුද?

හා එහෙනම් පිටත්වෙමු.



ඒ ග්‍රහලෝකය මොනවගේද? පෘතුවියට වඩා

ගොඩක් වෙනස්

දෙවියනේ ඇත්තටම

ඔව් මම ඇත්ත කියන්නේ ඔයාට පේනවද පෘතුවිය.

අපිට ගොඩක් දුරයි කියලා ඔව් මට හොඳට පේනවා.



ඒ ග්‍රහලෝකය මොනවගේද?

පෘතුවියට වඩා ලොකුයි.

හැබැයි පාටනම් වෙනස්.  අනේ පිටසක්වලයෝ මට

ඒ පාට කියන්න බැරිද?

බෑ ඒව රහස්.

අනේ පිටසක්වලයෝ... ඇයි සොෆියා?

මාව ඒ ග්‍රහලෝකය වටේ රවුමක් එක්කන් යන්න පුලුවන්ද? ඔව්. අනිවාර්යෙන්ම මම එක්කන් යනවාමයි. ඔයා දන්නවද සොෆියා?

මොකක්ද?

අපි ග්‍රහලෝකයට ළංවෙලා ඉන්නේ.

ඔයා ඔය ඇත්තටමද කියන්නේ?

ඔව් ඔන්න බලන්නකෝ මේක තමයි අපේ ග්‍රහලෝකය



අනේ ඒක හරිම ලස්සන ග්‍රහලෝකයක්නේ.

ඔව් ලස්සනයි තමා සොෆියා. පිටසක්වලයෝ ඔයා මාව මේ විශාල ග්‍රහලෝකය වටේ රවුමක් එක්කන් යනවා කිවුවා නේද? ඔව්. මම කිවුවනම් තමයි ඇයි සොෆියා? අනේ මට දැන්ම යන්න ඕනි එහෙනම් සොෆියා ඔයා අපේ යානයට නගින්නකෝ.

හරි මම නගින්නම්. අපි  ගමන ආරම්භ කරමු නේද?

ඔයාගේ කැමත්තක් සොෆියා.

සොෆියා මට පොඩි ප්‍රශ්නයක් තියනවාම

ඒ මොකක්ද පිටසක්වලයෝ?

ඔයා අපේ යානය දැකලා බය වුනේ නැත්තේ ඇයි?

පිටසක්වලයෝ කියන්නේ මම දැකපු ලොකුම හීනය.

අන්න ඒ නිසයි මම ඔයාගගෙ යානයට බය වුනේ

නැත්තේ.?

අනේ පිටසක්වලයෝ මම ඔයත් එක්ක කොච්චර

කතාකලත් මට ඔයාගේ නම දැනගන්න බැරිවුනානෙ.

ඉතින් ඔයාගේ නම මොකක්ද? මගේ නම තමා

ටෝලි. ටෝලි ඒ නම හරිම ලස්සනයි. ඔයාට

ගොඩාක් ස්තූතිය



අනේ ටෝලි මට හරිම බඩගිනියි. සොෆියා අපි

එහෙනම් අපේ ග්‍රහලෝකයට දැන්ම යමු නේද?

හරි එහෙනම් අපි යමු.



සොෆියා නැගිටින්න උදේ වෙලා ම මොකක් ටෝලි

ටෝලි...

සොෆියා... ඔයා ඒ දැකලා තියන්නේ හීනයක්

අනේ අම්මේ..



සොෆියා දුක්වෙන්න එපා. ඔයා පහළට එන්නකෝ.

හරි අම්මේ මම දැන්ම එනවා.

මොකක්...

ඔයාට සුබම සුබ උපන්දිනයක් සොෆියා...

ඔයාලට ගොඩාක් ස්තූතියි අම්මේ තාත්තේ...

මම ඔයාලට ගොඩාක් ආදරෙයි.

සොෆියා..

ඇයි අම්මේ?

මමයි තාත්තයි ඔයාට තෑග්ගක් ගෙනාවා.

තෑග්ගක් අනේ මට ඒක බලන්න ඕනේ .

මෙන්න පුතේ ඔයාගේ තෑග්ග.

අනේ පිටසක්වලයින්ගේ පොතක් නේද?

ඔව් පුතේ මේ එහෙම පොතක් තමයි.

මම ඔයාලට ගොඩාක් ආදරෙයි

ඊට පස්සේ එයාලා සතුටින් ජීවත් වුණා...





## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි. මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය. මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්